# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2148/19 - 2019 නොවැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2019.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(II)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 10 වන වගන්තියේ (එ) ඡේදය සමග කියවිය යුතු එකී පනතේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ච) ඡේදය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 01 දරන දැන්වීම් පුවරු සහ ප්‍රචාරක පුවරු පාලනය කිරීමේ (දෘෂ්ටි දූෂණය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොදාගනු ලබන යම් දැන්වීම් පුවරුවක්, ප්‍රචාරක පුවරුවක්, ආකෘතියක් හෝ උපාංගයක් මේ නියෝග සමග අනුකූල විය යුතු අතර ඒවා ස්වභාවික පරිසරය පිළිබඳ දර්ශනය, භූ දර්ශනය, දෘෂ්ටි ප්‍රසන්නතාවය සහ තැනැත්තන්ගේ ආරක්ෂාව අවහිර වන පරිදි ඉදිකරනු නොලැබිය යුතු ය.

3. යම් තැනැත්තකු විසින්, -

(අ) එම අධිකාරිය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තුවකට යටත්ව මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව ; සහ

(ආ) එම අදාළ අධිකාරිය විසින්, ස්වභාවික පරිසරය පිළිබඳ දර්ශනය, භූ දර්ශනය, දෘෂ්ටි ප්‍රසන්නතාවය සහ තැනැත්තන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි මාර්ගෝපදේශයන්ට අනුකූල වීමෙන් තොරව,

යම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොදා ගනු ලබන යම් දැන්වීම් පුවරුවක්, ප්‍රචාරක පුවරුවක්, ආකෘතියක් හෝ උපාංගයක් ඉදි කරනු නොලැබිය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. අදාළ අධිකාරිය විසින් මාස දොළහකට (12) නොවැඩි කාල සීමාවක් සඳහා බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු අතර එම අධිකාරිය විසින් අය කරනු ලැබිය හැකි අලුත් කිරීමේ ගාස්තුවකට යටත්ව වාර්ෂිකව බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකි ය.

5. යම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොද ගනු ලබන යම් දැන්වීම් පුවරුවක්, ප්‍රචාරක පුවරුවක්, ආකෘතියක් හෝ උපාංගයක්, 4 වන නියෝගය යටතේ බලපත්‍රය අලුත් කිරීමකින් තොරව මාස දොළහකට (12) වැඩි කාලයක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක දී, එම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොදා ගනු ලබන දැන්වීම් පුවරුව, ප්‍රචාරක පුවරුව, ආකෘතිය හෝ උපාංගය එම ස්ථානයෙන් ඉවත් කරන ලෙස අදාළ අධිකාරිය විසින් බලපත්‍රය දරන්නාට දැනුම් දිය යුතු ය.

6. 5 වන නියෝගය යටතේ අදාළ අධිකාරිය විසින් දැනුම් දෙන ලද පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොදා ගනු ලබන දැන්වීම් පුවරුවක්, ප්‍රචාරක පුවරුවක්, ආකෘතියක් හෝ උපාංගයක් ඉවත් නොකරන ලද අවස්ථාවක දී එම අධිකාරිය විසින් එය ඉවත් කළ යුතු අතර එම ඉවත් කිරීමේ දී වියදම බලපත්‍රය දරන්නාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

7. දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා යොදා ගනු ලබන යම් දැන්වීම් පුවරුවක්, ප්‍රචාරක පුවරුවක්, ආකෘතියකින් හෝ උපාංගයක්, -

(අ) තැනැත්තන්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ;

(ආ) ස්වභාවික පරිසරය පිළිබඳ දර්ශනය, භූ දර්ශනය සහ දෘෂ්ටි ප්‍රසන්නතාවය අවහිර වීම වැළැක්වීම සඳහා ; සහ

(ඇ) යම් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා,

ඉවත් කිරීමේ බලය අදාළ අධිකාරියට ඇත්තේ ය.

8. මේ නියෝගවල -

''දැන්වීම'' යන්නට භූමියක, ගොඩනැගිලි බිත්ති, ප්‍රචාරක පුවරු, රාමු, ප්‍රචාරක කුටි, කණු, ගස් ආවරණ, ගැන්ට්‍රි, සංචාරක රථවාහන, මාර්ගය, වාසස්ථාන හෝ තාවකාලික ආරුක්කු මත ප්‍රදර්ශනය කළ යම් වචනයක්, අක්ෂරයක්, සළකුණක්, සංඥා පුවරුවක්, බැනරයක්, බැලූනයක් සහ ආලෝකකරණය කරන ලද හෝ නොකරන ලද හෝ ඩිජිටල් ක්‍රමයට ප්‍රදර්ශිත (නිශ්චල හෝ චලනය වන) දැන්වීමක් ඇතුළත් වේ.

(3 වන නියෝගය)

**උපලේඛනය**

1. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
2. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
3. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරිය
6. පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන්
7. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය
8. 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
9. 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
10. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
11. 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
12. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
13. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
14. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභා
15. (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභා
16. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභා

11 - 1305

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.